**කටුවන ප්‍රාදේශීය සභාව - 2021**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

කටුවන ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ගිවිසුම් අත්සන් කළ එකතු වටිනාකම රු. 37,814,706 ක් වූ කර්මාන්ත 20 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන වෙන් කර නොතිබීම නිසා ජංගම වගකීම් හා වත්කම් එම වටිනාකමින්ම අඩුවෙන් දැක්වුණි. | මධ්‍යම රජයේ ප්‍රතිපාදන මත ඉටුකළ මෙම කර්මාන්ත 2021 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ නිමකර නොතිබූ බැවින් ණයගැති හා ණයහිමි ශේෂයන් ලෙස ගිණුම්ගත නොකළ බවත්, එමගින් මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් සිදුවී නොමැති බව. | ණයහිමි වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 1994 අංක 04 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව සභාවට නොලැබෙන 2015, 2016 හා 2019 වර්ෂයන්ට අදාළ ප්‍රමාද කාලය වසර 02 ට වඩා වැඩි රු. 6,475,245 ක මුද්දර ගාස්තු ලැබිය යුතු ආදායමක් ලෙස වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 27 දින ලද රු. 3,200,000 ක මුද්දර ගාස්තු මුදල් ලැබීම, ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමට නොගැළපීම නිසා ලැබිය යුතු මුද්දර ගාස්තු වැඩියෙන් දැක්වුණි. | බැංකුව වෙත සෘජුවම ලද මෙම මුදල් පිළිබඳව සභාව 2022 වර්ෂයේදී දැනුවත් වී රිසිට් පත්‍රයක් නිකුත් කළ බැවින් 2022 වර්ෂයේදී ගැලපීම් කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලෙස ගිණුම් ගත කළ යුතු එකතු වටිනාකම රු. 1,797,291 ක් වූ ඉන්වෙන්ට්‍රි ඒකක 88 ක් ලිබඩු හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබීම නිසා ජංගම නොවන වත්කම් එම වටිනාකමින්ම වැඩියෙන් දැක්වුණි . | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී කිරම නගරයේ ATM යන්ත්‍රයක් සවි කිරීමට ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු. 305,769 ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සරප් සතු අත ඉතිරි රු. 265,021 ක් මූල්‍ය ප්‍රකාශනවල අතැති මුදල් ලෙස නොදක්වා බැංකු ශේෂයට එකතු කර දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අතැති මුදල් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී රු. 211,220 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් කර තිබීම නිසා ප්‍රාග්ධන වියදම් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට ගෙවන ලද වැටුප් හා සභිකයන්ට ගෙවන ලද මන්ත්‍රී දීමනා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් රු. 137,044 ක් වැඩියෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබූ අතර එය ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,119,979 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,451,482 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **කුලී** | | |
| i. | සමාලෝචිත වර්ෂය සඳහා කඩ කාමර 20 කින් ලැබිය යුතු කඩ කුලී රු. 728,397 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි . | ඉතිරි හිඟ අයකර ගැනීමට නොහැකි වුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගනිමි. | වටිනාකමින් වැඩි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පුද්ගලයන්ගෙන් හා සමිති වලින් ලැබිය යුතු වාහන කුලී රු. 770,040 ක් හා රු. 107,660 ක ටෙන්ඩර් කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2013 වසරේ සිට පැවැත එන වාහන කුලී ශේෂය අයකර ගැනිමට නීතිමය කටයුතු සිදුකරමින් පවතින බවත්, රු.90,750 ක ටෙන්ඩර් කුලී සඳහා නඩු ගොනු කළ බවත්, රු.16,910 ක් කපා හැරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| iii. | 2018 වර්ෂයේදී බදු දුන් කඩ කාමර 08 කට අදාළ රු. 8,330,000 ක එක්වන් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| iv. | 2018 ඔක්තෝබර් 01 දින මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 ක් බදුගත් පාර්ශවය විසින් ගිවිසුමේ 2.1 වගන්තිය ප්‍රකාරව ගිවිසුම්ගත වූ දින සිට මාස 04 ක් ඇතුළත ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමට එකඟ වී තිබුණත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද ගිවිසුමේ 2.23 වගන්තිය පරිදි බදු දුන් කඩ කාමර නැවත සභාව වෙත පවරා ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | 2022.06.23 දිනැති මහා සභා තීරණය අනුව බදුකරු සමඟ ඉදිරියේදී සාකච්ඡාවක් පවත්වා එහිදී ගනුලබන තීරණ අනුව කටයුතු කරමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාරයක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයන් 3897 කින් ලැබිය යුතු ජල ගාස්තු රු. 9,749,818 ක් අයකර ගැනීම සඳහා ජල පාරිභෝගිකයන් සමඟ එළඹි ගිවිසුමෙහි 11 වන වගන්තිය පරිදි කටයුතු කිරීමට සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර හිගයෙන් රු. 474,438 ක් රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු ශේෂයකි. | රටේ පැවැති කොරෝනා වසංගතය හා අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ ජනතාවගේ පිඩනය අවම කිරීමේ අරමුණින් ජලය විසන්ධි කිරීම් සිදු නොකළ බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රණසිංහගොඩ පෙර පාසල වටා දැල් වැට සැකසීමේ කර්මාන්තයට අදාළව දැල් ජී.අයි බට වලට සවි කිරීම සඳහා මිලි මීටර් 20x60 ප්‍රමාණයේ පැතලි යකඩ රාමුවක් යෙදිය යුතු වුවත් එම කාර්යය ඉටු කර නොතිබියදී රු. 469,908 ක් ගෙවීම් කර තිබුණි. තවද මුදල් රෙගුලාසි 237(අ) (I) හා (III) අනුව කොන්ත්‍රාත් ගෙවීම් කිරීමේදී සහ අතරුදවුම් මුදල් ගෙවීම් කිරීමේදී ගිවිසුම හා ඇස්තමේන්තුව ප්‍රකාරව අදාළ ඉදිකිරීමේ කටයුතු නිමකර ඇති බවට සනාථ කරමින් නිර්දේශ ලබා දීම සිදුකළ යුතු වුවත් මෙම කර්මාන්තය ගිවිසුම හා ඇස්තමේන්තුව ප්‍රකාරව ඉටුකර නොතිබියදී තාක්ෂණික නිළධාරි විසින් එපරිදි ඉටුකර ඇති බව දක්වමින් ව්‍යාජ ගෙවීම් වාර්තා සකස් කර මුදල් ගෙවීම සිදු කර තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | ව්‍යාපෘතිය සඳහා වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීම හා ව්‍යාජ ගෙවීම් වාර්තා සකස් කළ පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |